ශ්‍රී ලංකා මහ බැංකුව
இலங்கை மத்திய வங்கி
CENTRAL BANK OF SRI LANKA

**සන්නිවේදන දෙපාර්තමේන්තුව**
30, ජනාධිපති මාවත, කොළඹ 01, ශ්‍රී ලංකාව
දුරකථන අංක: 2477424, 2477423, 2477311
ෆැක්ස්: 2346257, 2477739
ඊ-මේල්: dcommunications@cbsl.lk, communications@cbsl.lk
වෙබ් අඩවිය: www.cbsl.gov.lk

# පුවත්පත් නිවේදනය

| | |
|---|---|
| නිකුත් කළේ | **ආර්ථික පර්යේෂණ දෙපාර්තමේන්තුව** |
| දිනය | **2017 මාර්තු මස 27 වැනි දින** |

## 2016 දෙසැම්බර් මාසයේ දී විදේශීය අංශයේ ක්‍රියාකාරිත්වය

**සමස්ත නිරීක්ෂණ**

2016 දෙසැම්බර් මාසයේ දී ශ්‍රී ලංකාවේ විදේශීය අංශය මිශ්‍ර ක්‍රියාකාරිත්වයක් වාර්තා කළේය. අපනයන ආදායමෙහි වර්ධනයට වඩා ආනයන වියදම සැලකිය යුතු ලෙස ඉහළ යාම හේතුවෙන් 2016 දෙසැම්බර් මාසයේ දී වෙළඳ හිඟය පුළුල් විය. මෙම මාසය තුළ දී සංචාරක ඉපැයීම් සහ විදේශීය සේවා නියුක්තිකයන්ගේ ප්‍රේෂණ හිතකර වර්ධනයක් වාර්තා කළේය. 2016 දෙසැම්බර් මාසයේ දී කොළඹ කොටස් වෙළඳපොළ වෙත යම් ලැබීම් ප්‍රමාණයක් වාර්තා වුවද, රාජ්‍ය සුරැකුම්පත් වෙළඳපොළ වෙතින් ශුද්ධ ගෙවීමක් දැකිය හැකි විය.

**අපනයන ක්‍රියාකාරිත්වය**

සියලුම ප්‍රධාන අපනයන කාණ්ඩයන්හි ආදායම් ඉහළ යෑමක් පිළිබිඹු කරමින් 2016 දෙසැම්බර් මාසයේ දී අපනයන ආදායම පෙර වසරේ අනුරූප කාලපරිච්ඡේදයට සාපේක්ෂව එ.ජ.ඩොලර් මිලියන 859 ක් දක්වා සියයට 4.7 කින් වර්ධනය විය. ගෝලීය ආර්ථික තත්ත්වයන් ක්‍රමයෙන් වර්ධනයවීම සහ ප්‍රධාන වෙළඳ හවුල්කරුවන් සමඟ වෙළඳ සබඳතා වර්ධනයවීම කාර්මික සහ කෘෂිකාර්මික අපනයනවල ක්‍රියාකාරිත්වය කෙරෙහි වාසිදායක ලෙස බලපෑ අතර, එය 2016 දෙසැම්බර් මාසයේ දී අපනයන ආදායම ඉහළ යෑමට හේතු විය.

මුද්‍රණ කර්මාන්තය ආශ්‍රිත නිෂ්පාදිත සහ රබර් නිෂ්පාදිත අපනයන ආදායමේ සිදුවූ කැපී පෙනෙන වර්ධනය හේතුවෙන් ඉහළ ගිය කාර්මික අපනයන ආදායම, සමස්ත අපනයන

ආදායමේ වර්ධනය සඳහා විශාලතම දායකත්වය ලබාදුණි. ඒ අනුව, 2016 දෙසැම්බර් මාසයේ සමස්ත අපනයන ආදායමෙන් සියයට 76 ක් වූ කාර්මික අපනයන ආදායම පෙර වසරේ අනුරූප කාලපරිච්ඡේදයට සාපේක්ෂව එ.ජ.ඩොලර් මිලියන 655 ක් දක්වා සියයට 4.4 කින් වර්ධනය විය. ප්‍රධාන වශයෙන් මුදල් නෝට්ටු අපනයන ඉහළ යෑමේ ප්‍රතිඵලයක් ලෙස, 2016 දෙසැම්බර් මාසයේ දී මුද්‍රණ කර්මාන්තය ආශ්‍රිත නිෂ්පාදිත අපනයන ආදායම 2015 වසරේ අනුරූප මාසයට සාපේක්ෂව දෙගුණයකට වඩා වැඩි අගයකින් ඉහළ ගියේය. 2016 වසරේ අගෝස්තු මාසයේ සිට දක්නට ලැබුණු පෙර වසරේ අනුරූප මාසයට සාපේක්ෂව රබර් නිෂ්පාදිත අපනයන ආදායම ඉහළ යෑමේ ප්‍රවණතාවය තවදුරටත් පවත්වා ගනිමින්, රබර් නිෂ්පාදිත අපනයන ආදායම සියයට 6.7 කින් ඉහළ ගිය අතර, ඒ සඳහා ප්‍රධාන වශයෙන්ම ශල්‍ය අත්වැසුම් සහ අනෙකුත් අත්වැසුම් අපනයන ආදායම වර්ධනයවීම හේතු විය. කෙසේ වුවද, 2016 වසරේ දෙසැම්බර් මාසයේ දී කැනඩාව, චීනය, ඕස්ට්‍රේලියාව සහ එක්සත් අරාබි එමීර් රාජ්‍යය වැනි සාම්ප්‍රදායික නොවන වෙළඳපොළට මෙන්ම යුරෝපා සංගමය වෙත සිදු කරන ලද ඇඟලුම් අපනයන ආදායමේ වර්ධනයක් දක්නට ලැබුණද, ඇමෙරිකා එක්සත් ජනපද වෙළඳපොළෙන් වූ ඉල්ලුම අඩුවීම හේතුවෙන් මුළු අපනයන ආදායමෙන් සියයට 43 ක් වූ ඇඟලුම් අපනයන ආදායම පෙර වසරේ අනුරූප කාලපරිච්ඡේදයට සාපේක්ෂව එ.ජ.ඩොලර් මිලියන 368 ක් දක්වා සියයට 0.3 කින් සුළු වශයෙන් පහළ ගියේය. මෙම මාසය තුළ දී, කාර්මික අපනයන යටතේ වර්ග කර ඇති ආහාර පාන වර්ග සහ දුම්කොළ හැර සියලුම කාණ්ඩවල අපනයන ආදායම් ඉහළ ගියේය.

මුළු අපනයන ආදායමෙන් සියයට 23 ක් පමණ වූ කෘෂිකාර්මික අපනයන ආදායම 2016 දෙසැම්බර් මාසයේ දී පෙර වසරේ අනුරූප කාලපරිච්ඡේදයට සාපේක්ෂව එ.ජ.ඩොලර් මිලියන 201 ක් දක්වා සියයට 5.1 කින් වර්ධනය වූ අතර, ඒ සඳහා කුළුබඩු, පොල් සහ තේ අපනයන ආදායම් ඉහළ යෑම හේතුවිය. විශේෂයෙන්ම, ගම්මිරිස් සහ සාදික්කා ඇතුළු සියලුම කුළුබඩු වර්ගවල අපනයන ආදායම් වර්ධනයවීම පිළිබිඹු කරමින් 2016 දෙසැම්බර් මාසයේ දී කුළුබඩු අපනයන ආදායම පෙර වසරේ අනුරූප කාලපරිච්ඡේදයට සාපේක්ෂව සියයට 31.1 කින් කැපී පෙනෙන ලෙස වර්ධනය විය. පොල් මද ආශ්‍රිත නිෂ්පාදිත සහ පොල් මද ආශ්‍රිත නොවන නිෂ්පාදිත යන කාණ්ඩ දෙකෙහිම ඉහළ ක්‍රියාකාරිත්වය හේතුවෙන් පොල් අපනයන ආදායම පෙර වසරේ අනුරූප කාලපරිච්ඡේදයට සාපේක්ෂව සියයට 20.4 කින් වර්ධනය විය. අපනයන පරිමාවේ පහළ යෑමක් සිදුවුවද තේවල සාමාන්‍ය අපනයන මිල ඉහළ යෑම හේතුවෙන් 2016 දෙසැම්බර් මාසයේ දී තේ අපනයන ආදායම පෙර වසරේ අනුරූප කාලපරිච්ඡේදයට සාපේක්ෂව සියයට 4.4 කින් ඉහළ ගියේය. මීට අමතරව, යුරෝපා සංගමය විසින් ශ්‍රී ලංකාවෙන් මුහුදු ආහාර ආනයනය කිරීම සඳහා පනවා තිබූ තහනම 2016 ජූලි

මාසයේ සිට ඉවත් කිරීමෙන් පසු දක්නට ලැබුණු ඉහළ අපනයන වර්ධන ප්‍රවණතාව අඛණ්ඩව පැවතුණි.

සමුච්චිත වශයෙන් සැලකූවිට, 2016 වසරේ අග භාගයේ දී අපනයන ආදායම්වල හිතකර වර්ධනයක් දක්නට ලැබුණද, 2016 වසරේ මුළු අපනයන ආදායම එ.ජ.ඩොලර් මිලියන 10,310 ක් දක්වා සියයට 2.2 කින් පහළ ගියේය. පසුගිය වසරේ දී ප්‍රවාහන උපකරණ අපනයන ආදායම ඉහළ අගයක් වාර්තා කිරීම හේතුවෙන් මුළු අපනයන අඩුවීම සඳහා එය ප්‍රධාන වශයෙන් දායක වූ අතර, ඛනිජ තෙල් නිෂ්පාදිත, තේ සහ කුළුබඩු අපනයන ආදායම් පහළ යැමද අහිතකර ලෙස බලපෑවේය. ජාත්‍යන්තර වෙළඳපොළෙහි භාණ්ඩවල මිල ගණන් පහළ යෑම සහ අපනයන මූලික කරගත් කෘෂිකාර්මික නිෂ්පාදිතවල දේශීය සැපයුම පහළ යෑම, අපනයන ආදායම පහළ යෑම සඳහා දායක විය. කෙසේ වුවද, 2015 වසරට සාපේක්ෂව 2016 වසරේ දී රෙදිපිළි හා ඇඟලුම්, මූල ලෝහ හා උපාංග, සම්භාණ්ඩ, සංචාරක භාණ්ඩ, පාවහන් සහ යන්ත්‍රසූත්‍ර හා යාන්ත්‍රික උපකරණ ආශ්‍රිත අපනයන ආදායම් ඉහළ ගියේය.

2016 වසර තුළ ශ්‍රී ලංකාවේ භාණ්ඩ අපනයනය සඳහා ඇමෙරිකා එක්සත් ජනපදය, එක්සත් රාජධානිය, ඉන්දියාව, ජර්මනිය සහ ඉතාලිය ප්‍රධාන වෙළඳපොළ වූ අතර, ඒ සඳහා සිදුකළ අපනයන මුළු අපනයනවලින් සියයට 52 ක් පමණ විය.

## සංඛ්‍යා සටහන 1: අපනයන ආදායම (අ)

| කාණ්ඩය | 2015 දෙසැ. (එ.ජ.ඩො. මිලියන) (ආ) | 2016 දෙසැ. (එ.ජ.ඩො. මිලියන) | වෙනස (සියයට) | 2015 ජන-දෙසැ. එ.ජ.ඩො. මිලියන) (ආ) | 2016 ජන- දෙසැ. එ.ජ.ඩො. මිලියන) | වෙනස (සියයට) |
|---|---|---|---|---|---|---|
| **1. කාර්මික අපනයන** | **627.1** | **654.9** | **4.4** | **8,017.1** | **7,940.1** | **(1.0)** |
| රෙදිපිළි හා ඇඟලුම් | 393.4 | 393.6 | 0.0 | 4,820.2 | 4,884.1 | 1.3 |
| එයින් ඇඟලුම් | 369.2 | 368.1 | (0.3) | 4,555.6 | 4,602.7 | 1.0 |
| රබර් නිෂ්පාදිත | 58.5 | 62.4 | 6.7 | 761.2 | 767.9 | 0.9 |
| ආහාර පාන හා දුම්කොළ | 27.1 | 23.7 | (12.6) | 306.8 | 323.7 | 5.5 |
| ඛනිජතෙල් නිෂ්පාදිත | 30.3 | 30.8 | 1.7 | 373.9 | 286.9 | (23.3) |
| ප්‍රවාහන උපකරණ | 5.5 | 7.7 | 39.3 | 243.7 | 131.5 | (46.0) |
| රසායනික නිෂ්පාදිත | 10.8 | 11.1 | 2.8 | 126.4 | 126.3 | (0.1) |
| දැව සහ කඩදාසි නිෂ්පාදිත | 9.2 | 12.0 | 30.0 | 112.4 | 116.7 | 3.8 |
| මූල ලෝහ හා ඒ ආශ්‍රිත උපාංග | 4.3 | 6.9 | 61.4 | 55.8 | 89.6 | 60.5 |
| මුද්‍රණ කර්මාන්තය ආශ්‍රිත නිෂ්පාදිත | 4.5 | 12.1 | 168.0 | 45.7 | 42.4 | (7.2) |
| වෙනත් | 83.5 | 94.7 | 13.4 | 1,171.1 | 1,171.1 | 0.0 |
| **2. කෘෂිකාර්මික අපනයන** | **191.1** | **200.9** | **5.1** | **2,481.5** | **2,326.1** | **(6.3)** |
| තේ | 105.2 | 109.8 | 4.4 | 1,340.5 | 1,269.0 | (5.3) |
| රබර් | 2.3 | 3.2 | 41.6 | 26.1 | 32.7 | 25.0 |
| පොල් | 23.7 | 28.5 | 20.4 | 351.7 | 366.0 | 4.0 |
| කුළුබඩු | 24.4 | 32.0 | 31.1 | 377.4 | 317.1 | (16.0) |
| මුහුදු ආහාර | 15.0 | 17.4 | 16.0 | 163.1 | 169.6 | 4.0 |
| සුළු කෘෂිකාර්මික නිෂ්පාදිත | 14.4 | 5.7 | (60.6) | 160.4 | 114.1 | (28.9) |
| සකස් නොකළ දුම්කොළ | 3.7 | 2.5 | (31.2) | 31.8 | 31.2 | (2.0) |
| එළවළු | 2.4 | 1.7 | (29.8) | 30.5 | 26.5 | (13.0) |
| **3. ඛනිජ හා වෙනත් අපනයන** | **2.2** | **3.2** | **41.9** | **47.9** | **43.5** | **(9.1)** |
| **මුළු අපනයන** | **820.5** | **859.0** | **4.7** | **10,546.5** | **10,309.7** | **(2.2)** |

මූලයන්: ශ්‍රී ලංකා රේගුව
ජාතික මැණික් සහ ස්වර්ණාභරණ අධිකාරිය
ලංකා ඛනිජ තෙල් නීතිගත සංස්ථාව හා අනෙකුත් ඛනිජ තෙල් අපනයනකරුවන්
ශ්‍රී ලංකා මහ බැංකුව

**(අ)** **තාවකාලික**
**(ආ)** **සංශෝධිත**

**ආනයන ක්‍රියාකාරිත්වය**

අඛණ්ඩව තෙවැනි මාසයටත් 2016 දෙසැම්බර් මාසයේ දී ආනයන වියදමෙහි අංක දෙකකින් යුත් වර්ධනයක් වාර්තා විය. ඒ අනුව, අන්තර් භාණ්ඩ සහ ආයෝජන භාණ්ඩ ආනයන වියදම් ඉහළ යෑම හේතුවෙන් 2016 දෙසැම්බර් මාසයේ ආනයන වියදම පසුගිය වසරේ අනුරූප කාලපරිච්ඡේදයට සාපේක්ෂව එ.ජ.ඩොලර් මිලියන 1,816 ක් දක්වා සියයට 10.4 කින් ඉහළ ගියේය. කෙසේ වුවද, 2015 වසරේ දෙසැම්බර් මාසයේ සිට පැවති පෙර වසරේ අනුරූප කාලපරිච්ඡේදයට සාපේක්ෂව පාරිභෝගික භාණ්ඩ ආනයන වියදම පහළ යෑමේ ප්‍රවණතාව 2016 දෙසැම්බර් මාසයේ දී ද අඛණ්ඩව පැවතුණි.

2014 වසරේ අගෝස්තු මාසයට පසුව ප්‍රථම වතාවට එ.ජ.ඩොලර් බිලියන එකක සීමාව ඉක්මවමින්, 2016 දෙසැම්බර් මාසයේ මුළු ආනයන වියදමෙන් සියයට 55 ක් පමණ වූ අන්තර් භාණ්ඩ ආනයන වියදම පෙර වසරේ අනුරූප කාලපරිච්ඡේදයට සාපේක්ෂව සියයට 17.3 කින් ඉහළ ගියේය. ඉන්ධන ආනයන වියදම සියයට 51.8 කින් ඉහළ යෑම මුළු ආනයන වියදමේ වර්ධනය සඳහා විශාල වශයෙන් දායක විය. රටේ පැවති නියං තත්ත්වයන් හේතුවෙන් තාප සහ ගල්අඟුරු විදුලි බල උත්පාදනය ඉහළ යෑම නිසා පිරිපහදුකළ ඛනිජතෙල් ආනයන වියදම සියයට 113.8 කින් ඉහළ යෑම සහ ගල්අඟුරු ආනයන වියදම සියයට 10.4 කින් ඉහළ යෑම මේ සඳහා හේතු විය. ප්‍රධාන වශයෙන් රත්‍රන් ආනයන වියදම ඉහළ යෑම හේතුවෙන් 2016 දෙසැම්බර් මාසයේ දී දියමන්ති, අගනා ගල් සහ ලෝහ වර්ග ආනයන වියදම සැලකිය යුතු ලෙස වර්ධනය විය. මීට අමතරව, යකඩ හා මිශ්‍ර ලෝහ නොවන වානේ සහ තඹ කම්බි මූලික කරගත් මූල ලෝහ ආනයන වියදම ඉහළ යෑම සහ සිමෙන්ති ක්ලින්කර මූලික කරගත් ඛනිජ නිෂ්පාදිත ආනයන වියදම ඉහළ යෑම ආනයන වියදමේ වර්ධනයට දායක විය. කෙසේ වුවද, 2015 දෙසැම්බර් මාසයට සාපේක්ෂව 2016 දෙසැම්බර් මාසයේ දී පොහොර, රෙදිපිළි හා රෙදිපිළි උපාංග, තිරිඟු හා ඉරිඟු සහ ආහාර සැකසුම් ආනයන වියදම් පහළ ගියේය.

2016 දෙසැම්බර් මාසයේ දී මුළු ආනයන වියදමෙන් සියයට 25 ක් පමණ වූ ආයෝජන භාණ්ඩ ආනයන වියදම පෙර වසරේ අනුරූප කාලපරිච්ඡේදයට සාපේක්ෂව සියයට 13.1 කින් ඉහළ ගියේය. ඉදිකිරීම් අංශයේ සිදු වූ අඛණ්ඩ වර්ධනය වීම, ආයෝජන භාණ්ඩ ආනයන වියදම ඉහළ යෑම සඳහා ප්‍රධානතම හේතුව විය. 2016 දෙසැම්බර් මාසයේ දී යන්ත්‍ර සූත්‍ර හා උපකරණ ආනයන වියදම පසුගිය වසරේ අනුරූප කාලපරිච්ඡේදයට සාපේක්ෂව සියයට 12.2 කින් ඉහළ ගිය අතර, ඉංජිනේරු උපකරණ, විද්‍යුත් යන්ත්‍ර සූත්‍ර හා උපකරණ සහ කාර්යාලයීය කටයුතු සඳහා භාවිතයට ගන්නා යන්ත්‍ර ආනයන වියදම ඉහළ යෑම මේ සඳහා මූලික විය. මෙම මාසය තුළ, සිමෙන්ති, යකඩ හා වානේ සහ ඒ ආශ්‍රිත උපාංග ආනයනය ඉහළ යෑම

නිසා ගොඩනැගිලි ද්‍රව්‍ය ආනයන වියදම සියයට 15.2 කින් ඉහළ ගියේය. මීට අමතරව, ත්‍රි රෝද රථ, වාණිජ අරමුණු සඳහා භාවිත වන සහ කැබ්රථ වැනි වාහන ආනයනයෙහි කැපී පෙනෙන අඩුවීමක් සිදු වුවද, දුම්රිය මාර්ග ඉදිකිරීමේ උපකරණ සහ වැසි ආනයනය සඳහා වූ වියදම් ඉහළ යෑම හේතුවෙන් ප්‍රවාහන උපකරණ ආනයන වියදම ඉහළ ගියේය.

ආහාර හා පාන වර්ග යන කාණ්ඩ දෙකෙහිම සහ ආහාර නොවන පාරිභෝගික භාණ්ඩ ආනයන වියදම්වල පහළ යෑම් පිළිබිඹු කරමින් 2016 දෙසැම්බර් මාසයේ දී පාරිභෝගික භාණ්ඩ ආනයන වියදම සියයට 7.7 කින් පහළ ගියේය. එසේ වුවද, මෙම මාසය තුළ දී ආහාර හා පාන වර්ග යටතේ කාණ්ඩ කර ඇති සීනි හා රසකැවිලි, කිරි ආශ්‍රිත නිෂ්පාදිත සහ පාන වර්ග ආනයන වියදම් ඉහළ ගියේය. ආහාර නොවන පාරිභෝගික භාණ්ඩ සැලකීමේ දී බෙහෙත් සහ ඖෂධීය නිෂ්පාදිත, රථවාහන, ගෘහ උපකරණ සහ රෙදිපිළි හා උපාංග ආනයන වියදම් පහළ ගියේය.

සමුච්චිත වශයෙන් සැලකූවිට, ප්‍රධාන වශයෙන්ම යන්ත්‍රසූත්‍ර හා උපකරණ, රෙදිපිළි හා රෙදිපිළි උපාංග සහ රත්‍රන් සඳහා වූ ආනයන වියදම් ඉහළ යෑම හේතුවෙන් පසුගිය වසරට සාපේක්ෂව 2016 වසරේ දී ආනයන වියදම එ.ජ.ඩොලර් මිලියන 19,400 ක් දක්වා සියයට 2.5 කින් ඉහළ ගියේය. මීට අමතරව, ගොඩනැගිලි ද්‍රව්‍ය, සීනි හා රසකැවිලි සහ බෙහෙත් හා ඖෂධීය නිෂ්පාදිත ආනයන වියදම් ඉහළ යෑමද, ආනයන වියදම ඉහළ යෑමට සැලකිය යුතු ලෙස දායක විය. කෙසේ වුවද, 2015 වසරට සාපේක්ෂව 2016 වසරේ දී පෞද්ගලික භාවිතය සඳහා වන රථවාහන, ඉන්ධන සහ පොහොර ආනයන වියදම් පහළ ගියේය.

2016 වසර තුළ දී චීනය, ඉන්දියාව, එක්සත් අරාබි එමීර් රාජ්‍යය, සිංගප්පූරුව සහ ජපානය ප්‍රධාන ආනයන ප්‍රභවයන් වූ අතර, මෙම රටවල් වෙතින් සිදු කරන ලද ආනයන, මුළු ආනයනවලින් සියයට 57 ක් පමණ විය.


# සංඛ්‍යා සටහන 2: ආනයන වියදම (අ)


| කාණ්ඩය | 2015 දෙසැ. (එ.ජ.ඩො. මිලියන) | 2016 දෙසැ. (එ.ජ.ඩො. මිලියන) | වෙනස (සියයට) | 2015 ජන-දෙසැ (එ.ජ.ඩො. මිලියන) | 2016 ජන-දෙසැ (එ.ජ.ඩො. මිලියන) | වෙනස (සියයට) |
|---|---|---|---|---|---|---|
| **1. පාරිභෝගික භාණ්ඩ** | **383.8** | **354.2** | **(7.7)** | **4,713.5** | **4,319.0** | **(8.4)** |
| ආහාර හා පානවර්ග | 149.5 | 142.6 | (4.6) | 1,627.8 | 1,627.4 | (0.0) |
| එළවළු | 48.0 | 40.6 | (15.5) | 396.4 | 373.7 | (5.7) |
| සීනි හා රසකැවිලි | 16.4 | 22.5 | 37.1 | 254.4 | 344.6 | 35.5 |
| කිරි ආහාර | 21.3 | 29.6 | 39.0 | 250.9 | 249.3 | (0.6) |
| මුහුදු ආහාර | 27.1 | 19.1 | (29.5) | 221.1 | 237.3 | 7.3 |
| පාන වර්ග | 6.3 | 6.7 | 6.1 | 77.4 | 97.9 | 26.5 |
| වෙනත් ආහාර හා පාන වර්ග | 30.4 | 24.2 | (20.4) | 427.7 | 324.7 | (24.1) |
| ආහාරමය නොවන පාරිභෝගික භාණ්ඩ | 234.4 | 211.6 | (9.7) | 3,085.7 | 2,691.5 | (12.8) |
| රථ වාහන | 65.7 | 58.3 | (11.2) | 1,359.6 | 794.8 | (41.5) |
| බෙහෙත් හා ඖෂධීය නිෂ්පාදිත | 41.2 | 39.2 | (5.0) | 459.8 | 525.8 | 14.3 |
| වෙනත් ආහාරමය නොවන පාරිභෝගික භාණ්ඩ | 127.5 | 114.2 | (10.4) | 1,266.2 | 1,371.0 | 8.3 |
| **2. අන්තර් භාණ්ඩ** | **855.4** | **1,003.6** | **17.3** | **9,638.2** | **9,870.0** | **2.4** |
| ඉන්ධන | 216.2 | 328.2 | 51.8 | 2,699.6 | 2,481.0 | (8.1) |
| එයින් බොරතෙල් | 88.8 | 81.6 | (8.1) | 739.0 | 596.0 | (19.4) |
| පිරිපහදු කළ ඛනිජ තෙල් | 102.5 | 219.1 | 113.8 | 1,801.9 | 1,688.4 | (6.3) |
| ගල්අඟුරු | 24.9 | 27.5 | 10.4 | 158.7 | 196.7 | 23.9 |
| රෙදිපිළි හා රෙදිපිළි උපාංග | 241.4 | 227.9 | (5.6) | 2,296.2 | 2,704.9 | 17.8 |
| මූල ලෝහ | 31.1 | 59.9 | 92.3 | 470.6 | 456.1 | (3.1) |
| තිරිඟු හා ඉරිඟු | 35.0 | 25.6 | (26.6) | 357.2 | 249.2 | (30.2) |
| පොහොර | 28.0 | 7.3 | (74.0) | 289.6 | 136.9 | (52.7) |
| දියමන්ති, අගනා ගල් හා ලෝහ වර්ග | 14.2 | 73.8 | 421.3 | 161.5 | 514.4 | 218.5 |
| එයින් රත්‍රන් | 0.6 | 55.3 | 9,428.7 | 42.4 | 374.0 | 782.9 |
| ඛනිජ නිෂ්පාදිත | 9.3 | 21.0 | 125.2 | 230.8 | 222.1 | (3.8) |
| එයින් සිමෙන්ති ක්ලින්කර | 6.8 | 19.0 | 180.1 | 197.3 | 188.9 | (4.3) |
| වෙනත් | 280.2 | 259.9 | (7.2) | 3,132.7 | 3,105.4 | (0.9) |
| **3. ආයෝජන භාණ්ඩ** | **404.3** | **457.2** | **13.1** | **4,567.0** | **5,198.0** | **13.8** |
| යන්ත්‍රසූත්‍ර හා උපකරණ | 223.8 | 251.1 | 12.2 | 2,278.1 | 2,740.7 | 20.3 |
| ගොඩනැගිලි ද්‍රව්‍ය | 128.5 | 148.1 | 15.2 | 1,352.0 | 1,568.7 | 16.0 |
| ප්‍රවාහන උපකරණ | 50.9 | 55.4 | 8.8 | 930.9 | 880.2 | (5.5) |
| වෙනත් ආයෝජන භාණ්ඩ | 1.0 | 2.6 | 148.5 | 5.9 | 8.5 | 42.3 |
| **4. වර්ග නොකළ ආනයන** | **1.1** | **1.1** | **(0.2)** | **15.9** | **13.1** | **(17.9)** |
| **මුළු ආනයන** | **1,644.7** | **1,816.1** | **10.4** | **18,934.6** | **19,400.1** | **2.5** |

මූලයන්: ශ්‍රී ලංකා රේගුව
ලංකා ඛනිජ තෙල් නීතිගත සංස්ථාව
ලංකා අයි.ඕ.සී. සමාගම
ශ්‍රී ලංකා මහ බැංකුව

**(අ) තාවකාලික**

### රූප සටහන 1: අපනයන සහ ආනයන ක්‍රියාකාරිත්වය




මූලයන්:
ශ්‍රී ලංකා මහ බැංකුව
ශ්‍රී ලංකා රේගුව

#### වෙළඳ ශේෂය

මීට පෙර මාස දෙකෙහිම දක්නට ලැබුණු ප්‍රවණතාව අඛණ්ඩව පෙන්නුම් කරමින් 2016 දෙසැම්බර් මාසයේ දී වෙළඳ හිඟය 2015 දෙසැම්බර් මාසයේ දී පැවැති එ.ජ. ඩොලර් මිලියන 824 ට සාපේක්ෂව එ.ජ.ඩොලර් මිලියන 957 ක් දක්වා සැලකිය යුතු ලෙස පුළුල් විය. 2016 වසරේ සමුච්චිත වෙළඳ හිඟය, 2015 වසරේ වාර්තා වූ එ.ජ.ඩොලර් මිලියන 8,388 ට සාපේක්ෂව එ.ජ.ඩොලර් මිලියන 9,090 දක්වා ඉහළ ගියේය.

#### සංචාරක ඉපැයීම්

2016 දෙසැම්බර් මාසය තුළ දී වාර්තා වූ 224,791 ක පැමිණීම් සංඛ්‍යාව සමග පසුගිය වසරට සාපේක්ෂව සංචාරක පැමිණීම් සියයට 9.1 කින් වර්ධනය විය. ඒ අනුව, 2016 වසරේ දී පැමිණි මුළු සංචාරකයින් සංඛ්‍යාව 2,050,832 දක්වා වර්ධනය වූ අතර, එය 2015 වසරේ දී වාර්තා වූ 1,798,380 ක සංචාරක පැමිණීම්වලට සපේක්ෂව සියයට 14.0 ක වර්ධනයකි. ඉන්දියාව, චීනය, එක්සත් රාජධානිය, ජර්මනිය හා ප්‍රංශය යන රටවල් 2016 වසර දක්වා වූ සංචාරක පැමිණීම්වල ප්‍රධාන මූලාශ්‍ර පහ විය. එම රටවලින් පැමිණි සංචාරකයින් සංඛ්‍යාව මුළු සංචාරක පැමිණීම්වලින් සියයට 51.0 ක් විය. මේ අතර, 2016 වසරේ දෙසැම්බර් මාසය තුළ දී සංචාරක ඉපැයීම්[1] පෙර වසරේ දෙසැම්බර් මාසයට සාපේක්ෂව සියයට 12.9 ක වර්ධනයක් සමඟ එ.ජ.ඩොලර් මිලියන 385.7 ක් විය. 2016 වසර තුළ දී සමුච්චිත සංචාරක

---

1 2016 වසර සඳහා සංචාරකයෙකු මෙරට ගතකරන සාමාන්‍ය කාලසීමාව සහ සාමාන්‍ය දෛනික වියදම පිළිබඳ ශ්‍රී ලංකා සංචාරක ප්‍රවර්ධන අධිකාරිකයේ සමීක්ෂණ ප්‍රතිඵල අනුව සංශෝධනය විය.

ඉපැයීම් 2015 වසරේ දී වාර්තා වූ එ.ජ.ඩොලර් මිලියන 2,980.7 සිට එ.ජ.ඩොලර් මිලියන 3,518.5 දක්වා වර්ධනය විය.

**විදේශ සේවා නියුක්තිකයන්ගේ ප්‍රේෂණ**

2016 දෙසැම්බර් මාසයේ දී විදේශ සේවා නියුක්තිකයන්ගේ ප්‍රේෂණ, 2015 වසරේ දෙසැම්බර් මාසයේ දී වාර්තා වූ එ.ජ.ඩොලර් මිලියන 618.5 හා සැසඳීමේ දී එ.ජ.ඩොලර් මිලියන 684.6 දක්වා සියයට 10.7 ක වර්ධනයක් වාර්තා කළේය. ඒ අනුව, 2016 වසර තුළ දී විදේශ සේවා නියුක්තිකයන්ගේ ප්‍රේෂණවල සමුච්චිත ලැබීම්, 2015 වසරේ දී වූ එ.ජ.ඩොලර් මිලියන 6,980.3 හා සාපේක්ෂව එ.ජ.ඩොලර් මිලියන 7,241.5 ක් දක්වා සියයට 3.7 කින් වර්ධනය විය.

**මූල්‍ය ලැබීම්**

කොළඹ කොටස් වෙළඳපොළ වෙත වූ විදේශීය ආයෝජන 2016 වසරේ දෙසැම්බර් මාසයේ දී එ.ජ.ඩොලර් මිලියන 27.8 ක ශුද්ධ ලැබීමක් වාර්තා කළ අතර 2016 වසර තුළ එහි සමුච්චිත විදේශීය ආයෝජන එ.ජ.ඩොලර් මිලියන 19.1 ක ශුද්ධ ලැබීමක් වාර්තා කළේය. එය ද්විතීයික වෙළඳපොළ වෙත වූ එ.ජ.ඩොලර් මිලියන 4.9 ක ශුද්ධ ලැබීමකින් සහ ප්‍රාථමික වෙළඳපොළ වෙත වූ එ.ජ.ඩොලර් මිලියන 14.2 ක ලැබීමකින් සමන්විත විය. 2016 වසරේ දෙසැම්බර් මාසයේ දී වූ එ.ජ.ඩොලර් මිලියන 95.9 ක ශුද්ධ විදේශීය ආයෝජන ආපසු ගෙවීමක් සමඟ අඛණ්ඩව තුන්වන මාසයටත් රාජ්‍ය සුරැකුම්පත් වෙළඳපොළ වෙතින් ශුද්ධ විදේශ ආයෝජන ආපසු ගෙවීම් වාර්තා විය. 2016 වසර තුළ දී රාජ්‍ය සුරැකුම්පත් වෙළඳපොළ වෙතින් වූ ඉවත් කරගත් මුළු විදේශීය ආයෝජන ප්‍රමාණය 2015 වසරේ දී වාර්තා වූ එ.ජ.ඩොලර් මිලියන 1,093.4 හා සැසඳීමේ දී එ.ජ.ඩොලර් මිලියන 324.3 ක් විය. 2016 වසරේ දී රජය වෙත ලැබුණු දිගුකාලීන ණය ප්‍රමාණය 2015 වසරේ දී වාර්තා කළ එ.ජ.ඩොලර් මිලියන 469.6 ක ශුද්ධ ලැබීමට සාපේක්ෂව එ.ජ.ඩොලර් මිලියන 1,287.0 ක ශුද්ධ ලැබීමක් වාර්තා කළේය.

**ගෙවුම් තුලනයේ සමස්ත තත්ත්වය**

2016 වසර තුළ දී සමස්ත ගෙවුම් තුලනය 2015 වසර තුළ වාර්තා කළ එ.ජ.ඩොලර් මිලියන 1,488.7 ක හිඟයට සාපේක්ෂව එ.ජ.ඩොලර් මිලියන 499.7 ක හිඟයක් වාර්තා කර ඇති බව ඇස්තමේන්තු කර ඇත.

**ජාත්‍යන්තර සංචිත සහ විනිමය අනුපාතිකයේ හැසිරීම**

2016 වසරේ දෙසැම්බර් මස අවසානය වන විට ශ්‍රී ලංකාවේ දළ නිල සංචිත ප්‍රමාණය ආනයනික මාස 3.7 කට ප්‍රමාණවත් වන පරිදි එ.ජ.ඩොලර් බිලියන 6.0 ක් විය. දළ නිල සංචිතවලින් හා තැන්පතු භාරගන්නා ආයතන සතු විදේශීය වත්කම්වලින් සමන්විත මුළු විදේශීය වත්කම් ප්‍රමාණය ආනයනික මාස 5.2 කට සමාන වන පරිදි එ.ජ.ඩොලර් බිලියන 8.4 ක් විය.

2016 වසරේ දී එ.ජ.ඩොලරයට එරෙහිව සියයට 3.8 ක අවප්‍රමාණය වීමක් වාර්තා කළ ශ්‍රී ලංකා රුපියල 2016 වසර අවසානයේ සිට 2017 මාර්තු මස 24 වැනි දින දක්වා කාලපරිච්ඡේදය තුළ දී, තවදුරටත් සියයට 1.2 ක අවප්‍රමාණයක් වාර්තා කළේය. අනෙකුත් විදේශ ව්‍යවහාර මුදල්වල විනිමය අනුපාතිකවල හැසිරීම පිළිබිඹු කරමින් 2017 මාර්තු මස 24 වැනි දින දක්වා කාලපරිච්ඡේදය තුළ දී ශ්‍රී ලංකා රුපියල යූරෝවලට එරෙහිව සියයට 3.2 කින් ද, ස්ටර්ලින් පවුමට එරෙහිව සියයට 2.8 කින් ද, ජපන් යෙන්වලට එරෙහිව සියයට 5.5 කින් ද, කැනේඩියානු ඩොලරයට එරෙහිව සියයට 1.9 කින් ද, ඕස්ට්‍රේලියානු ඩොලරයට එරෙහිව සියයට 6.1 කින් සහ ඉන්දියානු රුපියලට එරෙහිව සියයට 4.8 කින් ද අවප්‍රමාණය විය.

## සටහන 3: විදේශීය අංශයේ ක්‍රියාකාරිත්වයෙහි සාරාංශය (අ)

| කාණ්ඩය | 2015 දෙසැ. (එ.ජ.ඩො. මිලියන) | 2016 දෙසැ. (එ.ජ.ඩො. මිලියන) | වෙනස (%) | 2015 ජන.-දෙසැ. (එ.ජ.ඩො. මිලියන) | 2016 ජන.-දෙසැ. (එ.ජ.ඩො. මිලියන) | වෙනස (%) |
|---|---|---|---|---|---|---|
| අපනයන | 820.5(ආ) | 859.0 | 4.7 | 10,546.5(ආ) | 10,309.7 | (2.2) |
| ආනයන | 1,644.7 | 1,816.1 | 10.4 | 18,934.6 | 19,400.1 | 2.5 |
| වෙළඳ ශේෂය (අතිරික්තය (+)/හිඟය(-)) | -824.2(ආ) | -957.1 | 16.1 | -8,388.1(ආ) | -9,090.3 | 8.4 |
| සංචාරක ඉපැයීම් (ආ) | 341.6 | 385.7 | 12.9 | 2,980.7 | 3,518.5 | 18.0 |
| විදේශ සේවා නියුක්තිකයින්ගේ ප්‍රේෂණ | 618.5 | 684.6 | 10.7 | 6,980.3 | 7,241.5 | 3.7 |
| කොළඹ කොටස් වෙළඳපොළ වෙත වූ ලැබීම් (ශුද්ධ) (ඇ) | -3.4 | 27.8 | (907.9) | 4.0 | 19.1 | 375.3 |
| රාජ්‍ය අංශයේ ලැබීම් (ඈ) | 339.8 | 292.5 | (13.9) | 4,705.0 | 4,955.3 | 5.3 |
| එයින්, | | | | | | |
| භාණ්ඩාගාර බිල්පත් සහ භාණ්ඩාගාර බැඳුම්කර | 5.8 | 26.1 | 346.4 | 1,210.9 | 1,238.2 | 2.3 |
| ජාත්‍යන්තර ස්වෛරීත්ව බැඳුම්කර | - | - | - | 2,150.0 | 1,500.0 | (30.2) |
| ඒකාබද්ධ ණය පහසුකම | - | - | - | - | 700.0 | - |
| දිගුකාලීන ණය (ඉ) | 320.5 | 236.5 | (26.2) | 1,267.8 | 1,462.9 | 15.4 |
| විදේශීය සෘජු ආයෝජන (ඊ) | - | - | - | 677.6 | 444.5 | (34.4) |

මූලයන් : ශ්‍රී ලංකා ආයෝජන මණ්ඩලය
ශ්‍රී ලංකා රේගුව
ශ්‍රී ලංකා මහ බැංකුව
ශ්‍රී ලංකා සංචාරක සංවර්ධන අධිකාරිය
කොළඹ කොටස් වෙළඳපොළ

(අ) තාවකාලික

(ආ) සංශෝධිත

(ඇ) ප්‍රාථමික සහ ද්විතියික වෙළඳපොළ ගනුදෙනු ඇතුළත් වේ.

(ඈ) රජයට ලැබුණු ප්‍රාග්ධන සහ ජංගම සංක්‍රාම, භාණ්ඩාගාර බිල්පත් හා බැඳුම්කර මත විදේශ ආයෝජකයන් විසින් කරන ලද ආයෝජන, ජාත්‍යන්තර ස්වෛරීත්ව බැඳුම්කර, ඒකාබද්ධ ණය පහසුකම් සහ රජයට ලැබුණු දිගුකාලීන ණය යනාදිය රාජ්‍ය අංශයේ ලැබීම් තුළ ඇතුළත් වේ.

(ඉ) ඒකාබද්ධ ණය පහසුකම රහිත

(ඊ) දත්ත පවතිනුයේ පළමු මාස නවය සඳහා වන අතර, ශ්‍රී ලංකා ආයෝජන මණ්ඩලය විසින් වාර්තා කළ පරිදි සෘජු ආයෝජන සමාගම් වෙත වූ විදේශීය ණය ඇතුළත් වේ.